# පළමුවන තේමාව - ලෝකය තුළ පවතින දේව ක්‍රියාකාරීත්වය

2

## 1.2. දක්වමු විස්කම් දෙවිඳුගෙ මහිමෙන්..



නූතන සන්නිවේදන ක්ෂේත්‍රයේ නවතම සොයා ගැනීමක් ලෙස ජංගම දුරකථනය දැක්විය හැකි ය. විවිධ මිල ගණන් යටතේ නොයෙක් නොයෙක් මාදිලියේ ජංගම දුරකථන වෙළඳ පොළේ අලෙවි වේ. ඕනෑ ම තැනකට ඉතා පහසුවෙන් රැගෙන යා හැකි ය. කෙටි පණිවුඩ යැවීම, අන්තර් ජාලයට පිවිස තොරතුරු ලබා ගැනීම, කථා කරන්නා දර්ශනය වීම, ඡායාරූප ගැනීම හා යැවීම සහ විද්‍යුත් තැපැල් සේවය වැනි විවිධ සේවාවන් රැසක් මෙ මගින් ඉටු කර ගත හැකි ය. මෙය භාවිත කිරීමෙන් මිනිසාගේ යහපත සඳහා ද අයහපත සඳහා ද ඉඩ සැලසේ.

### නව නිපැයුම් තුළින් ප්‍රකාශ වන දේව මහිමය

- විද්‍යාව වනාහි දෙවිඳුන් දුන් බුද්ධියෙන් සිදු කළ මිනිස් සොයා ගැනීම් සමුදායක් විනා, එය මිනිසාගේ ආශ්චර්යමත් මැවීමක් නොවේ. එසේ නම් එය ආරම්භයේ දී ම මේ විශ්වය තුළ ජනිතව තිබිණි. දේව සමානත්වය ලද මනුෂ්‍යයාට බුද්ධියක් ද නිර්මාණාත්මක හැකියාවක් ද සුවිශේෂ දක්ෂතා ද උරුම ව ඇත.

- අධි තාක්ෂණික නිපැයුම් හමුවේ අභ්‍යවකාශය පවා තරණය කළ මිනිසා මැවිල්ල තුළ බොහෝ දෑ අනාවරණය කරගෙන ඇත.

- දෙවියන් වහන්සේ ලෝකය තුළ ස්ථාපිත කර ඇති විවිධ බල ශක්තීන් සොයාගෙන විද්‍යාත්මක හා තාක්ෂණික ප්‍රගතියක් ලබා ඇත. ඒ මගින් මනුෂ්‍යයා දේව මහිමය වඩ වඩාත් අත්දැකිය යුතු ය. මේ තුළින් දේව බල පරාක්‍රමය තේරුම් ගත යුතු ය.

**මේ ගැනත් සිතන්න.**

දෙවිඳුන්ගේ බල මහිමය කොතරම් විශාල ද?
දෙවිඳුන් සම ගුරුවරයෙක් තවත් ඇද්ද?
දෙවිඳුන් යා යුතු මග නියම කරන්නට සමතා කවරේ ද?
'ඔබ වරද කර ඇතැ'යි සමිඳාණන්ට කීමට කාට හැකි ද?
මිනිසුන් කවදාත් සමිඳාණන්ට පැසසුම් දී ඇත; ඔබත් සමිඳාණන්ට පැසසුම් දීමට සිතට ගන්න.

(ජෝබ් 36:2224)

මට නො පෙනෙන තැනක සැඟවීමට කිසිවකුට නො හැකි ය. මා ස්වර්ගයේත්, පොළොවේත් සැම තැන ම වැඩ සිටින බව නුඹලා නො දන්නහු ද?

(ජෙරමියා 23:24)

**පංති කාමරය තුළ ඔබට මෙය කළ හැකි දැ යි බලන්න.**

කුඩා කණ්ඩායම් පහකට බෙදී

- යහපත හා විනාශය ගැන කරුණු විදහා දැක්වීමට පෝස්ටරයක් බැගින් නිර්මාණය කරන්න.

(නව දැනුම සොයා යන මිනිසාට සිදු වන යහපත හා අයහපත පෝස්ටරයෙන් අවධාරණය විය යුතුයි.)

**කණ්ඩායම් මාතෘකා :**

- ✪ සෞඛ්‍ය ක්ෂේත්‍රය
- ✪ සන්නිවේදනය
- ✪ ආහාර
- ✪ ගමනාගමනය
- ✪ ඉදිකිරීම්

උදා : සෞඛ්‍ය ක්ෂේත්‍රය

| යහපත | අයහපත |
|---|---|
| 1.<br>2.<br>3.<br>4. | |

**මනුෂ්‍ය ක්‍රියාකාරිත්වයේ අගය.**
**එහෙයින් මනුෂ්‍යයා විසින් තමාගේ ම දක්ෂකමින් හා ශක්තියෙන් කරනු ලබන වැඩ දෙවියන් වහන්සේගේ බලයට පටහැනි වෙති යි සිතීම වැරදි ය. මනුෂ්‍ය වර්ගයාගේ ජයග්‍රහණයන් දෙවියන් වහන්සේගේ මහෝත්තම භාවයේ ලකුණක් බව ද උන්වහන්සේ ගේ වර්ණනා විෂය ඉක්මවා යන සැලැස්ම සමෘද්ධියට පැමිණවීමක් බව ද ක්‍රිස්තු භක්තිකයෝ දනිති.**

**(දෙවන වතිකාන මන්ත්‍රණ සභාවේ වර්තමාන ලෝකයේ ශුද්ධ වූ සභාව නම් විශ්ව ප්‍රකාශනය අංක 34)**

**දෙවිඳුන්ගේ මහිමයෙන් මනුෂ්‍යයා ලෝකය තුළ දක්වූ විස්කම් පිළිබඳ නිදසුන් කීපයක්**

| | |
|---|---|
| නිකලස් කොපර්නිකස් | සූර්යයා වටා පෘථිවිය ගමන් කරන බව සොයාගැනීම. |
| ගැලීලියෝ ගැලලි | දුර දක්නය සොයාගැනීමෙන් පෘථිවිය ගෝලාකාර බව පෙන්වීම. |
| අයිසෙක් නිව්ටන් | ගුරුත්වාකර්ෂණ බලය සොයාගැනීම. |

**නිවැරදි හෘදය සාක්ෂිය.**

**යහපත හා අයහපත පිළිබඳ ව දෙවියන් වහන්සේ විසින් ලියන ලද නීතියක් මනුෂ්‍ය හදවතේ ඇත්තේ ය. එය හෘදය සාක්ෂියයි. ඊට කීකරුවීම මනුෂ්‍යයාට ගෞරවයකි. මනුෂ්‍යයා විනිශ්චය කරනු ලබන්නේ ද ඒ අනුව ය. නිවැරදි හෘදය සාක්ෂියක් විසින් පාලනය කරනු ලබන ප්‍රමාණය අනුව මනුෂ්‍යයාගේ යහපත් පැවැත්ම රඳා පවතී.**

**(දෙවන වතිකාන මන්ත්‍රණ සභාවේ වර්තමාන ලෝකයේ ශුද්ධ වූ සභාව නම් විශ්ව ප්‍රකාශනය අංක 16)**

**මගේ ජීවිතය සඳහා..**

- මා තාක්ෂණය අනිසි ලෙස යොදාගෙන තිබෙනවා ද?
- තාක්ෂණය අපේ ස්වාමියා නොවේ. දෙවියන් වහන්සේගෙන් අපට ලැබුණු දායාදයකි. දෙවියන් වහන්සේ සියල්ලෙහි මැවුම්කරු වේ.
- දැනුම වේගයෙන් පැතිරී යන අතර එයට අනුකූල ව මා නිතර ම යාවත්කාලීන විය යුතු ය.
- මගේ ජීවිතයට අදාළ හා අවශ්‍ය නිපැයුම් පමණක් තෝරා ගනිමි.
- මා මැවිල්ලේ අයිතිකරු නොව භාරකරු ය.
- මා මැවුම්කරුවකු ලෙස කටයුතු කළොත් ලෝකය විනාශ වේ.
- නූතන තාක්ෂණය අන් අයට බාධාවක් නොවන ලෙස යොදා ගනිමි.
- ආධ්‍යාත්මික ජීවිතය තුළින් මට සියලු දේ ජයගත හැකි ය.
- නව ලෝකයක් ගොඩනැගීමට දෙවියන් වහන්සේ මා කැඳවා ඇත.

**ඔබට මේවා කළ හැකි දැ යි බලන්න.**

1. මැවීමේ උතුම්කම පෙන්වන ගීතාවලියේ 104 සම්පූර්ණයෙන් කියවා මැවිල්ල තුළ ඔබ දේව බලය අත්දැක ඇති ආකාර ලියන්න.

2. නූතන ලෝකය තුළ මිනිසාගේ යහපතට හා විනාශයට හේතු වී ඇති සාධක ලැයිස්තු දෙකකට ඇතුළත් කරන්න.

3. "විද්‍යාව සහ තාක්ෂණය මඟින් දේව මහිමය වඩ වඩාත් අනාවරණය කරගත හැකි ය." යන අදහස සනාථ කිරීමට කරුණු පහක් ඉදිරිපත් කරන්න.

## මැවුම්කරුට ප්‍රශංසාව

සමිඳුනි ලස්සන ලොව ඔබගෙයි...ං

සමිඳුනි ලස්සන ලොව ඔබගෙයි
විශ්වය මුළු මෙන් ඔබට නතුයි
මනු හදවත් ඔබ වෙතට ඇදෙයි
සැම ඔබගෙන් බැව් සිතට නැගෙයි

පැසසුම් වේ පැසසුම් වේ
පැසසුම් ගී තුති ඔබට පිදේ

ලස්සන දිය ඇලි ගඟ කෙරුවා
ලස්සන මිණි කැට හැංගෙව්වා
හිරු සඳුගෙන් ලොව එළි කෙරුවා
පල වැළ තුරු මත බර කෙරුවා

පැසසුම් වේ පැසසුම් වේ
පැසසුම් ගී තුති ඔබට පිදේ

(කිතුනු ගී අංක 02)

(පුබුදු ගීතාංජලී 55)

4. මෙම ගීතිකාවේ අදහස අනුව දේව ප්‍රශංසා යාච්ඤාවක් නිර්මාණය කරන්න.

5. දේව මහිමය ප්‍රකාශ කරන ගීතිකා දෙකක් නම් කරන්න.


නොමිලේ බෙදා හැරීම සඳහා ය.

6. පහත සඳහන් ප්‍රකාශනවල අදහස් සාකච්ඡා කරන්න. අදහස් ගොනු කර වගුවක් ලෙස ඉදිරිපත් කරන්න.

- "තාක්ෂණය හේතු කොටගෙන කාර්යක්ෂමතාව වර්ධනය විය"
- "තාක්ෂණයෙන් උපරිම ඵල ලබාගැනීමට නම් එය නිවැරදි ව භාවිත කළ යුතු ය"
- "තාක්ෂණය හුදු මනුෂ්‍ය නිර්මාණයක් නොව මනුෂ්‍යයා තුළින් ක්‍රියාත්මක වන දෙවියන් වහන්සේගේ නිර්මාණයකි."